# රාජකාරි කටයුතු නැවත ආරම්භ කිරීම

## සඳහා මගපෙන්වීමක්

v 1.0 - 21/05/2020

ශ්‍රී ලංකාව තුළ COVID-19 පැතිරයාම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් 2020 මාර්තු 16 වන දින රටේ ගමනාගමනය ඇතුළුව බොහෝ කටයුතු තාවකාලිකව අත්හිටුවීමට තීරණය කරන ලදී. ඒ අනුව සමාගම් හා ආයතන රාශියක කටයුතු නැවැත්වීමට සිදුවිය. මෙම තත්ත්වය සති 6 කට වැඩි කාලයක් පැවති අතර, මේ වනවිට එම ව්‍යාපාර හැකි ඉක්මනින් නැවත ආරම්භ කිරීම සඳහා සැලසුම් කෙරෙමින් පවතී.

මේ ආකාරයට ව්‍යාපාර කටයුතු හැකි ඉක්මනින් ආරක්ෂා කිරීමේ අවශ්‍යතාව පැහැදිලි නමුත්, මෙවැනි කාලසීමාවකට පසුව නැවත කටයුතු ආරම්භ කිරීමේදී විවිධ අවදානම් වලට මුහුණ පෑමට සිදුවීමට ඉඩ තිබේ. යන්ත්‍ර සූත්‍ර වල දෝෂ මෙන්ම ගිනි හා පිපිරීම් ආදියද මෙම අවදානම් වලට අයත්ය. නැවත ආරම්භ කිරීමට පෙර පූර්ව පරීක්ෂාවන් සිදුකිරීම, මෙම අවදානම් අවම කරගැනීම සඳහා අදාළ කර්මාන්ත විසින් අනුගමනය කරනු ලබන එක් වැදගත් පියවරකි. මේ අතරින් ඇතැම් පරීක්ෂාවන් හා අනෙකුත් විධිවිධාන වෙනත් කර්මාන්ත වලටද වැදගත් විය හැකි අතර, ඒවා පහත විස්තර කර තිබේ.

ඉහත සඳහන් කළ අවදානම් අතරින්, ගිනි අවදානම අවම කරගැනීම අතිශයින් වැදගත්ය. කාර්යාල පරිශ්‍රය තුළ ගින්නක් ඇතිවීමේ අවදානම ඇත්නම් එය කල්තබා හඳුනාගෙන ඒ සඳහා පිළියම් යෙදීම අනිවාර්යයෙන් සිදුකළ යුතුවේ.

**මෙහිදී පහත සඳහන් ආරක්ෂක ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම සුදුසුය.**

**සුපුරුදු ක්‍රියාවලි වල සිදුවී ඇති වෙනස්කම්:**

- අවසාන වරට රාජකාරි කළ කාලයේදී කටයුතු කළ ආකාරය සහ දැන් පවතින තත්ත්වය අතර කුමන ආකාරයේ වෙනස්කම් පවතීදැයි හඳුනාගන්න. මෙහිදී උපකරණ, සැලසුම්, අමුද්‍රව්‍ය හා මෙහෙයුම් පරිසරය ඇතුළුව තවත් දේවල් වෙනස් වී තිබිය හැක.
- අවදානම් හඳුනා ගැනීම, මෙහෙයුම් පටිපාටිය, පුහුණු කිරීම් සම්බන්ධ දේවල්, ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ විධිවිධාන සහ අනෙකුත් ලිපිලේඛන විශ්ලේෂණය කර, පවතින තත්ත්වයට අනුව යාවත්කාලීන කරන්න.

**කාර්ය මණ්ඩලය හා සම්පත්:**

- රාජකාරි කටයුතු සඳහා අත්‍යවශ්‍ය වන පුද්ගලයන් කවුදැයි හඳුනාගෙන, ඔවුන්ගේ සේවය ලබාගත හැකි ආකාරයට විධිවිධාන සලසන්න.
- අවම කාර්ය මණ්ඩලයක් සේවයේ යෙදෙන බව තහවුරු කරගන්න.
- අනතුරුදායක ස්ථාන වල රාජකාරි කටයුතු නැවත ආරම්භ කිරීමේදී, එම ස්ථානයේ කාර්ය මණ්ඩලය හැකිතාක් සීමා කිරීම සුදුසුය.
- පැනනැගිය හැකි නව අවදානම් සාකච්ඡා කර හඳුනාගෙන ඒවා සඳහා පිළියම් යොදන්න. රාජකාරි කටයුතු ආරම්භ කිරීමට පෙර, අදාළ යන්ත්‍රෝපකරණ සහ ක්‍රියාපටිපාටි/හදිසි තත්ත්ව විධිවිධාන ආදිය සම්බන්ධයෙන් දැනුම හා මතකය අලුත් කරවීම සඳහා වන පුහුණු වැඩසටහන් වහාම ක්‍රියාත්මක කරන්න.
- කොන්ත්‍රාත් සේවකයන් සම්බන්ධයෙන් මනා පාලන සහ නිරීක්ෂණ විධිවිධාන ක්‍රියාත්මක කරන්න.

**යන්ත්‍රෝපකරණ:**

- යන්ත්‍රෝපකරණ කාලයක් තිස්සේ අක්‍රීය කර තබන ලද්දේ නම්, නිෂ්පාදක සමාගම මගින් ප්‍රකාශයට පත්කර ඇති පරීක්ෂණ/නඩත්තු ක්‍රියාපටිපාටි පරීක්ෂා කර, නැවත පණගැන්වීම හා ලිහිසි ද්‍රව්‍ය යෙදීම ආදිය සම්බන්ධයෙන් ලබාදී ඇති නිර්දේශ හඳුනාගන්න.
- අවශ්‍ය පරිදි පූර්ණ පිරිසිදු කිරීම් හා විෂබීජහරණය කිරීම් සිදුකරන්න.
- විදුලි බල හා ජල සැපයුම් පද්ධති ආදිය හොඳ තත්ත්වයේ තිබේදැයි පරීක්ෂා කරන්න. (කලක් තිස්සේ භාවිතයට නොගැනුණු ස්ථාන විශේෂයෙන් පරීක්ෂා කරන්න).

- සියලුම යන්ත්‍රෝපකරණ, ක්‍රියාවලි ආරක්ෂණ විධිවිධාන, අනතුරු ඇඟවීම් සංඥා සහ සම්බන්ධිත ස්ථාන ආදිය ක්‍රියාකාරී මට්ටමේ පවතින බව තහවුරු කරගන්න.

- පණගැන්වීම ආරම්භයේදී අනුගමන කළ යුතු සියලුම විධිවිධාන නිවැරදිව අනුගමනය කළ යුතුය.

- සංකීර්ණ ක්‍රියාවලි සහිත නිෂ්පාදන යන්ත්‍රාගාර සියල්ල පියවරෙන් පියවර පරීක්ෂාවට ලක්කළ යුතුය.

- ඉන්ධන වාෂ්ප වාතයට එකතු වීම මගින් පිපිරීම් ඇතිවීමේ අවදානම සහිත උපකරණ වලට විශේෂ අවධානයක් ලබාදිය යුතුය (බොයිලේරු හා පෝරණු වැනි).

**ජ්වලන ප්‍රභව:**

- අධික තාපයෙන් යුත් ගිනි පුළිඟු විහිඳු වන කාර්යයන් (විදුලි පෑස්සුම් වැනි), දුම් උපකරණ, ජංගම තාපන උපකරණ, බැටරි බලයෙන් ක්‍රියාකරන උපාංග ආදිය සම්බන්ධ විධිවිධාන දැඩිව ක්‍රියාත්මක කරන්න.

- විදුලි සැපයුම සම්බන්ධ නිරීක්ෂණ, පරීක්ෂාවන් සහ නඩත්තු කටයුතු යාවත්කාලීන බව තහවුරු කරගන්න.

**ගින්නකදී හෝ වෙනත් හදිසි අවස්ථාවකදී ගතයුතු ක්‍රියාමාර්ග:**

- ගිනි ආරක්ෂණ පද්ධති හා අනෙකුත් ආරක්ෂණ පද්ධති (දුම් හඳුනා ගැනීමේ පද්ධති, ජල පොම්ප, ජලය ඉසීමේ හා විදීමේ පද්ධති ආදිය) ක්‍රියාකාරී මට්ටමේ පවතින බව තහවුරු කරගන්න. දුරස්ථ නිරීක්ෂණ පද්ධතිද පරීක්ෂා කරන්න.

- ගින්නකදී කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් සකස් කර ඇති සැලසුම් නැවත විශ්ලේෂණය කර, ඒවා නිවැරදි බව තහවුරු කරගන්න.

- හදිසියකදී සහය වීම සඳහා අවශ්‍ය පුද්ගලයන් හා උපකරණ සූදානම් බව තහවුරු කරගන්න.

- අවශ්‍ය නම්, මෙහෙයුම් කටයුතු නැවත ආරම්භ කිරීම සම්බන්ධයෙන් ප්‍රදේශයේ ගිනි නිවන හමුදාව දැනුවත් කරන්න.

**පරිශ්‍රය නඩත්තු කිරීම:**

- පරිශ්‍රයේ සියලුම ස්ථාන පිරිසිදුව හා පිළිවෙළට පවත්වාගන්න. විශේෂයෙන්ම අනවශ්‍ය ද්‍රව්‍ය, වහා ගිනිගන්නාසුලු ද්‍රව්‍ය හා අපද්‍රව්‍ය ඉවත් කරන්න.

- මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට පෙර ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ, ජල හා විදුලි සැපයුම් ආදිය, ගබඩා පරිශ්‍ර, ගිනි නිවන උපාංග, හදිසි අවස්ථා වලදී භාවිතා වන පද්ධති සහ ලිපිලේඛන ආදිය මැනැවින් පරීක්ෂා කරන්න.

- මෙහෙයුම් ආරම්භ කිරීමේදී සහ නිෂ්පාදන කටයුතු සිදුකිරීමේදී ඉහළ මට්ටමේ ගබඩා ක්‍රමවේද අනුගමනය කරන්න (උදා: ගබඩා ස්ථාන අතර පැහැදිලි ඉඩක් පවත්වා ගැනීම, හිස් පැලට් ගබඩා නොකිරීම හෝ අවම කිරීම, භාවිතා කළ නොහැකි ද්‍රව්‍ය වෙන්කර තැබීම, රසායන ද්‍රව්‍ය හා අන්තරායකර ද්‍රව්‍ය ගබඩා කිරීමේදී ඒ සම්බන්ධ ආරක්ෂක විධිවිධාන නිසි පරිදි අනුගමනය කිරීම).

**ආරක්ෂක විධිවිධාන සහ පිවිසුම් ස්ථාන:**

- නිසි ආරක්ෂක විධිවිධාන ක්‍රියාත්මකව පවතින බව තහවුරු කරගන්න.

- මෙහෙයුම් කටයුතු සිදු නොවූ කාලයේ වැවී තිබීමට ඉඩ ඇති වල් පැළෑටි ආදිය ගලවා ඉවත් කරන්න.

- එළිමහනේ ගබඩා කිරීම් අවම කරන්න. එසේ ගබඩා කරන අවස්ථා වලදී ගොඩනැගිලි වලින් ඈත්කර ගබඩා කරන්න.



**වැඩි විස්තර සඳහා අමතන්න:**
ලලීන්ද්‍ර වික්‍රමසිංහ, ජ්‍යෙෂ්ඨ කළමනාකරු - අවදානම් ඉංජිනේරු
ජංගම: 0777 238 034 | විද්‍යුත් තැපෑල: laleendraw@fairfirst.lk

**වගකීම් අත්හැරීමේ ප්‍රකාශය:** මෙම ලේඛනයේ සඳහන් කරුණු ඔබගේ දැනුවත් වීම සඳහා පමණක් දක්වා ඇති අතර, ඒවා උපදෙස් ලෙස නොසැලකිය යුතුය. එම නිසා, මෙහි සඳහන් කරුණු ක්‍රියාවට නැංවීමට අදහස් කරන්නේ නම්, ඒ සඳහා විශේෂඥ සහය ලබාගැනීම සුදුසු වේ.

*corporatesolutions.swissre.com මගින් ප්‍රකාශයට පත්කර ඇති කරුණු පදනම් කරගෙන මෙම ලේඛනය පිළියෙල කරන ලදී.*